ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රධාන කාර්යාලය සහ ගොවිපල වල මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ධාවන තත්ත්වයේ පවතින මණ්ඩලය සතු කැබ් රථ / ජීප් රථ,ලොරි,මෝටර් බයිසිකල් හා ට්‍රැක්ටර් 201 ක් හා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර තිබුණු කැබ් රථ 20 ක් සම්පූර්ණයෙන්ම ක්ෂයකර තිබුණ නමුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව නැවත අගය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමක් හෝ කර නොතිබුණි.

(ආ) 2004 - 2007 වර්ෂවල මිලදී ගෙන සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ, තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා රු.109,177,233 ක් පිරිවැය වූ වත්කම් නැවත අගය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආනයනික එළ ගවයින් 498 දෙනාගේ වටිනාකම වූ රු. 288,503,235 ක මුදල ගිණුම් ගත කර තිබුණද, එයට මිය ගිය ගවයින් 08 දෙනාගේ වටිනාකම හා අලුතින් බිහි වූ පැටවුන්ගේ වටිනාකම ගලපා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කිරි ව්‍යාපෘතියේ රු.12,379,621 ක් වූ සමුච්චිත තොග ඌනතාවයද ඇතුලත්ව අවසන තොග පොත් අගය ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ශුද්ධ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) කිරි ව්‍යාපෘතියට අදාලව පවත්වාගෙන යනු ලැබූ රු.135,752,768 ක් වටිනා හර ලෙජර් ගිණුම් 157 ක් හා රු.141,239,417 ක් වටිනා බැර ලෙජර් ගිණුම් 70 ක් ඇතුළත් ප්‍රධාන ලෙජරය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 06 යටතේ දක්වා ඇති දේපල පිරියත උපකරණ ක්ෂය වලට අදාල ඉකුත් වර්ෂයේ අවසන් ශේෂ සහ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ අතර රු.455,621 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ ගොවිපල ගිණුම් වල දැක්වූ ඉතිරි තොගයේ වටිනාකම හා ඊට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

විස්තරය	ගොවිපල ගිණුම් අනුව		භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව		වෙනස	
	ඒකක ප්‍රමාණය	වටිනාකම	ඒකක ප්‍රමාණය	වටිනාකම	ඒකක ප්‍රමාණය	වටිනාකම
		රු.		රු.		රු.
ගොවිපල 10 ක පොල් තොගය (ගෙඩි)	1,409,810	23,209,669	1,775,928	23,807,619	366,118	597,950
ගොවිපල 7 ක කොප්පරා තොගය (කිලෝ)	8,868	835,912	8,025	4,571,595	843	3,735,683
ගොවිපල 11 ක පශු සම්පත් තොගය (සතුන්)	17,497	47,349,599	16,125	36,983,449	1,372	10,366,150
					368,333	14,699,783

1.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

බදු ගණනය කිරීමේ ප්‍රකාශය අනුව 2012 වර්ෂයේ ගෙවිය යුතු බදු මුදල රු.19,007,523 ක් හා ආර්ථික සේවා ගාස්තුව රු.9,335,257 ක් ලෙස දක්වා තිබුණු අතර අදායම් ප්‍රකාශයට අනුව එය රු.3,126,841 ක් හා රු.2,633,345 ක් වූ නමුත් වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බඩ ඉරිඟු ව්‍යාපෘතියට අදාලව 2009 වර්ෂයේ සිට පැවත එන කන්තලේ ලංකා බැංකු ශාඛාවෙන් අයවිය යුතු රු.2,092,750 ක් හා බඩ ඉරිඟු බීජ ණය පදනම මත ගොවීන්ට ලබාදීම නිසා ගොවීන්ගෙන් අයවිය යුතු රු.207,848 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2003 වර්ෂයේදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලබා ගත් රු. 102,662,700 ක ණය මුදලින් රු. 2,550,000 ක් පමණක් නිරවුල් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී මීට අදාල සමුච්චිත හිඟ පොලී මුදල රු.88,475,763 ක් විය.

(ඇ) පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ නිර්දේශ අනුව හම්බන්තොට ප්‍රදේශයේ ගොවීන් වෙත ලබාදී තිබුණු කුකුළු පැටවුන් වෙනුවෙන් 2009 වර්ෂයේ සිට අයනොවී පවතින රු.1,070,435 ක් බොල් ණය වශයෙන් කපාහැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීතිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යාල අලෙවි සැලට අදාල වසර 3 වඩා පැරණි රු.2,770,787 ක ණයගැති ශේෂයක් අයකර ගෙන නොතිබුණි.

(ඉ) වර්ෂ 5 වඩා පැරණි රු.300,038 ක ණය හා වර්ෂ 1-3 අතර පවතින රු.3,211,941 ක ණය මහවැලි පශු සම්පත් ආයතනයෙන් ප්‍රධාන කාර්යාලයට හා ගොවිපලවල් 02 ට අයවීමට තිබෙන අතර එම ආයතනය දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දී ඇති බැවින් එම ණය මුදල අයවීමට අවිනිශචිතව තිබියදී සමාලෝචිත වර්ෂයේදීද රු.5,752,594 ක් වටිනා කුකුළු පැටවුන් ණය පදනම මත එම ආයතනයට ලබා දී තිබුණි.

(ඊ) ගොවිපලවල් 05 ක පවතින වසර 05 ඉක්මවූ වෙළඳ ණයගැතියන් හා ගොවිපල ණයගැතියන් පිළිවෙලින් රු.481,820 ක් හා රු.583,714 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(උ) තැරව්කරුවන්ගෙන් අයවිය යුතු වසර 05 කට වඩා පැරණි රු.1,096,950 ක ණය ශේෂ හා වසර 3-5 අතර පවතින අයවිය යුතු ණය ශේෂය රු.3,026,675 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

	විස්තරය	මුදල රු.	ඉදිරිපත් නොකළ සාක්ෂි
i.	වසර 5 ඉක්මවූ සිලෝන් ග්‍රේන් සමාගමට ගෙවිය යුතු මුදල	26,746,567	(i) ශේෂ සනාථ කිරීම් (ii) අදාල ගනුදෙනුව පිළිබඳ විස්තර
ii.	බඩ ඉරිඟු ව්‍යාපෘතියේ ප්‍රයෝජනයට නොගත් වත්කම්	98,188	භාණ්ඩ සමීක්ෂණ වාර්තා
iii.	ගොවිපල 15 ක පශු සම්පත් තොග	108,584,823	නිසි පරිදි සකසන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තා
iv.	ගොවිපල 6 ක පොල් තොගය	17,055,180	- එම -
v.	ගොවිපල 07 ක කොප්පරා තොගය	901,792	- එම -
vi.	කලින් ගෙවීම් (අයාලේ යන කිරි ගවයින් හා එළුවන් ඇල්ලීමේ වියදම)	1,584,470	(i) ශේෂය සැදුම් ලත් ආකාරය (ii) අල්ලන ලද සතුන් සංඛ්‍යාව

1.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
(අ)	1972 අංක 11 දරන කෘෂිකාර්මික සංස්ථා පනතෙහි 6 වන ඡේදය	-	අධ්‍යක්ෂකවරුන් 07 දෙනෙකුගෙන් අධ්‍යක්ෂක මණ්ඩලය සමන්විත විය යුතු වුවද අධ්‍යක්ෂකවරුන් 08 ක් අධ්‍යක්ෂක මණ්ඩලයට ඇතුලත් වී තිබුණි.
(ආ)	1971 අංක 38 දරන මුදල් පනතේ 16(2)(අ) හා (ආ) වගන්ති	52,128,111	බැංකු අයිරා ලබාගැනීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ හා අදාල අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
	මු. රෙ. 371	1,078,042	අදාල කාර්යය නිම කල විගස ලබා ගත් අත්තිකාරම් නිරවුල් කල යුතු වුවද, මණ්ඩලයේ නිලධාරීන් හා විවිධ ආයතන වෙත 2011 වර්ෂයේ ලබාදී තිබුණු අත්තිකාරම් පියවා තිබුණේ 2013 වර්ෂයේදීය.
	මු.රෙ. 1645	-	මණ්ඩලය සතු කිසිදු වාහනයක් සඳහා ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි.
(ඈ)	අංක 842 දරන 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ තෙවන උප ලේඛනයේ 2.11 හා 2.12 ඡේද	-	චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඉ)	2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය		
	6.5.1 ඡේදය	-	කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.
	8.3.8 ඡේදය	1,521,801	අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව පරිත්‍යාග සිදු කර තිබුණි.
(ඊ)	2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය		
	2.14 ඡේදය	972,000	(i) 2011 වර්ෂයේදී ලියාපදිංචි පවිත්‍රතා සේවා සපයන ආයතන විසින් ඉදිරිපත් කල රු.72,000 ක අවම ලංසුවට කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබූ අතර මිල ගණන් ඉදිරිපත් නොකරන ලද ලියාපදිංචි නොවූ ආයතනයක් වෙතින් මසකට රු.81,000 ක මුදලකට පවිත්‍රතා සේවය ලබා ගෙන සමාලෝචිත වර්ෂයේදීද ඒ සඳහා රු.972,000 ක් එකී ආයතනයට ගෙවා තිබුණි. (ii) මැල්සිරිපුර ගොවිපලේ නව ආපනශාලාව,

		මුළුතැන්ගෙය සහ වැසිකිළි පද්ධතිය ඉදිකිරීමේ ඇසතමේන්තුගත වටිනාකම රු.10,612,035 ක් වූ අතර ඒ සඳහා අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු වූවත්, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව, මෙම ඉදි කිරීමේ කාර්යයන් කොටස් කර කලාපීය සුළු ටෙන්ඩර් මණ්ඩල නිර්දේශය මත ඉදි කිරීම් කටයුතු සිදු කර තිබුණි.
(උ) අංක 5 /2007 හා 2007 ජනවාරි 07 දිනැති මණ්ඩලීය චක්‍රලේඛය	3,920,000	රුපියල් මිලියන 1 ට වැඩි භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනවලදී ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වුවද වාහන අලුත්වැඩියාවන්ට අදාල ප්‍රසම්පාදන 02 ක් කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත සිදුකර තිබුණි.

1.2.8 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.9 හා 9.3.1 (ආ) ඡේද ප්‍රකාරව රු.200,000ට වඩා වැඩි මෝටර් රථ අලුත්වැඩියාවන් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී වාහන 02 ට සිදුකර තිබුණු රු.3,920,000 ක් වටිනා අලුත්වැඩියා සඳහා එම අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතියද ලබා ගෙන නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාල අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගොවිපලවල් 07 ක් විසින් ඇස්තමේන්තු මුදල වූ රු.31,879,703 ක් ඉක්මවා රු.21,689,357 ක් විවිධ කාර්යයන් සඳහා වියදම් කර තිබුණි.

(ඇ) කොට්ටුකච්චිය ගොවිපල විසින් මී ගවයින් 18 දෙනෙකු මස් පිණිස අලෙවි කිරීමට ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී මී ගවයින් 70 දෙනෙකු රු. 1,541,565 ක මදලකට මස් පිණිස අලෙවි කර තිබූ අතර, ඇස්තමේන්තු අගයන් විශාල ලෙස වෙනස් වීමට හේතු කළමනාකරණය විසින් සොයා බලා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.26,294,245 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.234,103,899ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.207,809,654 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. විකුණුම් පිරිවැය රු.244,946,408 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ගොවිපල 31 ක් අතුරින් ගොවිපල 16 ක් රු.141,229,672 ක ශුද්ධ අලාභයක් වාර්තා කර තිබුණි.

(ආ) මණ්ඩලයට අයත් මුළු වරලත් අලෙවිසැල් 111 න් අලෙවිසැල් 18 පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අතර සමාලෝචිත වර්ෂයේ වරලත් අලෙවිසැල් ව්‍යාපෘතියේ ශුද්ධ අලාභය රු.2,624,826 ක් විය.

(ඇ) දියර කිරි ව්‍යාපෘතිය යටතේ ඉදි කල මුළු අලෙවි සැල් 152 න් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අලෙවිසැල් 82 න් ලැබූ ලාභය හා පාඩුව ගණනය කර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේ අලුතින් අලෙවිසැල් කිසිවක් ආරම්භ කර නොතිබුණි.

3.2. සමාලෝචිත වර්ෂයේ සකස් කර ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුවට අනුකූලව කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය

රොසිටා ගොවිපල

ඇස්තමේන්තුවට ඇතුලත් නොවූ මූලධන වැය විෂයයන් 03 ක් සඳහා රු.858,761 ක් වැය කර තිබුණු අතර ඇස්තමේන්තුවට ඇතුලත් කර තිබූ මලධන වැය විෂයයන් 04 ක් සඳහා රු.1,439,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, එකී කාර්යයන් කිසිවක් සිදු කර නොතිබුණි. එසේම තෘණ වගාව සඳහා රු. 500,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද තෘණ වගාව සිදු කර නොතිබුණි.

කොට්ටුකච්චිය ගොවිපල

සත්ව ව්‍යාපෘති තුනකින් හා වෙනත් ව්‍යාපෘතියකින් රු.6,152,840 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද ලැබූ සත්‍ය ආදායම රු.1,729,746 ක් විය.

පරසන්ගස්වැව ගොවිපල

ඇස්තමේන්තු අනුව සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරකම් 04 ක් සදුකර රු. 4,673,000 ක ආදායමක් අපේක්ෂා කලද මෙම කාර්යයන් කිසිවක් සිදුකර ආදායම් උපයා නොතිබුණි.එසේම ඇතිකිරීම සඳහා හා මස් පිණිස සතුන් අලෙවියෙන් සහ එළකිරි හා කිරි ටොෆ අලෙවියෙන් රු.8,001,150 ක ආදායමක් ඉලක්ක කර තිබුණද සත්‍ය ආදායම රු.1,748,083 ක්වූ නමුත් මීට හේතු කළමනාකරණය විසින් සොයා බලා නොතිබුණි.

3.3 කළමනාකරණ ආකාර්යක්ෂමතා

(අ) රිදියගම ගොවිපලෙන් අක්කර 150 ක් 2001 වර්ෂයේ සිට පුද්ගලයින් 98 දෙනෙකු විසින් අනවසර වගා කටයුතු සඳහා අත්පත් කරගෙන ඇති අතර ඔවන් ගොවිපලෙන් ඉවත් කිරීමට මණ්ඩලය මෙතෙක් අපොහොසත් වී තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ඔක්තෝබර් 06 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු රුපියල් මිලියන 10 ක ලාභාංශ මෙතෙක් ගෙවා නොතිබුණි.

(ඇ) 1992 වර්ෂයේදී මහ භාණ්ඩාගාරයෙන් ලබාගත් රු.50,000,000 ක පොලී රහිත ණය මුදල සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දැනට ක්‍රියාත්මක නොවන බඩ ඉරිඟු ව්‍යාපෘතියට අදාලව 2010 ජූනි මාසයේ සිට අක්‍රියව ඉදිරයට එන බැංකු ගිණුම් 03 ක් ශේෂය රු.885,470 ක් විය.

(ආ) කන්තලේ බඩ ඉරිඟු ව්‍යාපෘතිය සඳහා 2011 වර්ෂයේදී රු. 3,517,579 ක් වැය කර සකස් කරන ලද විදුලි වැට, ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා නිෂ්කාර්ය වත්කමක් බවට පත් වී තිබුණි.

3.5 හඳුනාගන්නා ලද පාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගොවිපලවල් 14 ක රු.2,207,692 ක් වටිනා විවිධ වර්ගයේ සතුන් 944 ක් මියගොස් තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී රු.582,240 ක් වැයකර වෑන් රථයක් අලුත්වැඩියාකර තිබුණද විගණන දිනය වූ 2013 ජූලි 11 වන විටද එය භාවිතයට නොගෙන ගරාජයේ තබා තිබුණි.

(ඇ) වීරවිල සංචාරක නිවාසය දින 05 ක් බාහිර පාර්ශවයන් වෙත නොමිලේ ලබා දීම නිසා රු.75,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මැල්සිරිපුර ගොවිපලේ නව ආපනශාලාවට සවිකර තිබුණු වායු සමීකරණ යන්ත්‍ර 2 ක් සඳහා රු.200,000 ක් ප්‍රධාන කාර්යාලයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණ අතර ඒ සඳහා ගොවිපල විසින්ද සැපයුම්කරුවකු වෙත රු.195,690 ක් ගෙවා තිබුණි.

(ආ) සත්ව ආහාර හා ගව පැටවුන් ප්‍රවාහනය කිරීමට අවශ්‍ය කැබ් රථ 03 ක් කල්බදු ක්‍රමයට මිලදී ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අනුමැතිය දී තිබුණු නමුත් තක්සේරු වටිනාකම රු.3,150,000 ක්වූ පාවිච්චි කරන ලද එක් කැබ් රථයක් පමණක් රු.3,850,000 ක් ගෙවා අනුමැතියකින් තොරව අත්පිට මුදලට මිලදී ගෙන තිබුණු අතර එම රථය මිලදී ගත් දින සිට මිලදී ගත් කාර්යයට යොදවා නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ සේවයෙන් ඉවත්වූ සේවකයෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.42,540 ක මුදලක් පාරිතෝෂිත වශයෙන් වෙන් කර තිබුණු අතර වැලිකන්ද ගොවිපලේ සේවකයින් දෙදෙනෙකුගේ වයස අවුරුදු 108 ලෙස දක්වා රු.68,066 ක පාරිතෝෂිත වෙන් කර තිබුණි.

3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

මැල්සිරිපුර ගොවිපලේ නව ආපන ශාලාව හා මුළුතැන් ගෙය ඉදිකිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මැල්සිරිපුර නව ආපනශාලාව ඉදිකිරීමේදී රු.2,870,962ක් වටිනා ඇලුමිනියම් වැඩවල අන්තර්ගත කර ඇති දොරවල් හා ජනෙල් සඳහා විස්තරාත්මක පිරිවිතරයන් දක්වා නොතිබීමෙන් එම කාර්යයන් නියමිත ආකාරයෙන් සිදුකර ඇත්දැයි පරීක්ෂා කල නොහැකි විය.

(ආ) අවසාන ගෙවීම් වාර්තාවට අනුව ඇලුමිනියම් දොරවල් දෙකක් හා ජනෙල් 07 ක් සවිකිරීමට සහ ඇලුමිනියම් යොදා දික් අඩි 350 ක ආපනශාලාවේ ඇතුලත කොටසක් වෙන්කිරීමට (partitioning) රු.2,430,300 ක **වියදමක් දරා තිබුණද කළමනාකාරිත්වයේ තීරණයක් අනුව පසුව එම කොටස් ගලවා ඉවත්කිරීම නිසා එම වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.**

(ඇ) නිශ්චිත පිරිවිතරයන් ඇතුලත්කර සකස් කරන ලද ඇස්තමේන්තුවට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගෙන මුළුතැන් ගෙය ඉදිකිරීම සඳහා රු.820,852 ක් නව ආපනශාලාව ඉදිකල කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

3.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 දෙසැම්බර් 31 දින වන විට කාර්ය මණ්ඩල පුරප්පාඩු 275 ක් පැවතුණු අතර එම තනතුර පුරප්පාඩුව පැවති කාලය මාස 4 සිට මාස 30 ක කාලයක් අතර පරාසයක් ගෙන තිබුණි.

(ආ) බඳවා ගැනීමේ කාර්ය පරිපාටියේ සඳහන් තනතුරුවලට අදාල සුදුසුකම් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් 05 ක් සමාලෝචිත වර්ෂයේදී බඳවා ගෙන තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

4.1 සංයුක්ත සැලැස්ම

ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා 2008 හා 2012 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද එය කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ගොවිපල 13 කට අදාලව ක්‍රියාකාරකම් 19 ක ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

2012 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර 2012 වර්ෂයේ ඉදි කිරීම් මෙම සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

4.4 අයවැය පාලනය

අයවැය දත්ත සහ තථ්‍ය දත්ත අතර විචලනයේ ප්‍රතිශතය සියයට 2 සිට සියයට134 දක්වා වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

මණ්ඩලය විසින් 2010 හා 2011 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) ස්ථාවර වත්කම් පරිපාලනය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය

(ඈ) අත්තිකාරම් ගෙවීම්

(ඉ) මෙහෙයුම් කළමනාකරණය

(ඊ) මූල්‍ය කළමනාකරණය

(උ) අයවැය පාලනය